**භාෂා සංස්කරණය** - ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
එස්.ඕ. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ (විශ්‍රාමික)
ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා
සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

දෛනික ජීවිතය සාර්ථක ව පවත්වා ගැනීම හා යහපත් සමාජයක් ගොඩනැංවීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොටගෙන, පාසල් නර්තන අධ්‍යාපනය මගින් එකී නිපුණතා සංවර්ධනයට මාර්ගෝපදේශකත්වය සැපයීමට මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත. නර්තන විෂය භාර ව කටයුතු කරන ගුරු භවතුන් මෙම අත්පොත පරිශීලනයේ දීත් පංති කාමර ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දීත් ලබන ස්වකීය අත්දැකීම් ද සැලකිල්ලට ගත යුතු වේ.

06 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශය නිපුණතා 07 කින් සමන්විත ය. ඊට අදාළ නිපුණතා මට්ටම් 27 ක් යටතේ ක්‍රියාකාරකම් 32 ක් පෙළ ගස්වා ඇත. නිපුණතා, නිපුණතා මට්ටම් හා සබැඳි ක්‍රියාකාරකම්වල අන්තර්ගත විෂය සන්ධාරයෙන් ලබන දැනුමින් පමණක් පෝෂිත ව විභාගවලින් ඉහළ සාමර්ථ්‍ය ලබාගත්ත ද යහපත් ජීවිතයක් ගත කිරීමට එය ප්‍රමාණවත් නොවේ. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයෙන් හිස, හදවත හා දෑත් ද පෝෂණය කළ යුතු වේ. එකී පෝෂණයෙන් තමා ද සමාජය ද යහපත් මාවතක් කරා යොමු කරවීමට ගැළපෙන ජීවිතය නංවාලීම අද්‍යතන යුගයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවකි.

උක්ත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරකම් සරල ව පෙළගස්වා ඇති අතර විෂය අන්තර්ගතය දක්වා ඇත්තේ සංක්ෂිප්ත වශයෙනි. ක්‍රියාකාරකම් සැලසුම සඳහා දී ඇති උපදෙස්වල පියවර 01 සඳහා ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාදීමට වඩාත් සුදුසු කාර්යක්ෂම හා නිර්මාණශීලී ඉගෙනුම් ප්‍රවේශ භාවිත කළ හැකි ය. නර්තන විෂය ඉගෙනුම් ක්‍රමශිල්ප විවිධ ය. එමෙන් ම සුවිශේෂ ය. ක්‍රියාකාරකම හා ශිෂ්‍ය ශක්‍යතා හඳුනාගනිමින් අපේක්ෂිත ඉගෙනුම් ඵල කරා ළඟා වීමට හැකි වඩාත් ඵලදායී ඉගෙනුම් ක්‍රම තෝරා ගැනීමට අවකාශ ඇත.

ප්‍රායෝගික කුසලතා සංවර්ධනයේ දී වඩාත් සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට ගුරුවරයා මැදිහත්කරුවකු විය යුතු ය. කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී මනා ආකල්ප මෙන් ම සමූහයක් වශයෙන් ජීවත් වීමේ දී අනුගමනය කළ යුතු ජීවන පුරුදු පිළිබඳ අත්දැකීම් ලබා ගත හැකි ආකාරයට ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු වේ. පංතියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් කළ යුතු ය. ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයන් සපයා ගෙන ආ යුතු රංග උපකරණ හා ද්‍රව්‍ය ඇත්නම් ඒ බව කලින් දැනුම් දීම අත්‍යවශ්‍ය වේ. ගුරු මාර්ගෝපදේශයෙහි එක් එක් නිපුණතා මට්ටම්වල ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති කාලය වඩාත් ඵලදායී ලෙස භාවිත කළ හැකි අතර, අධ්‍යාපන විද්‍යාත්මක පදනමින් දක්වා ඇති වාර සටහන් ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත ඇගැයීම් ක්‍රියාවලිය තුළ සංගත බව ආරක්ෂා වේ.

පාඩම සංවර්ධනයට අදාළ කර ගත හැකි ඉගෙනුම්/ඉගැන්වීම් උපකරණ ගුණාත්මක යෙදවුම් ලෙස ඉදිරිපත් කර ඇති අතර වෙනත් සුදුසු භෞතික හා මානව සම්පත් සැලසුම් සහගත ව භාවිත කිරීම අපේක්ෂා කෙරේ. සෑම ක්‍රියාකාරකමක් ම විනෝදය, කුතුහලය, අළුත් අත්දැකීම් හා ප්‍රායෝගික වීම වැදගත් වේ. ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පින්තූර, වගු, දෘශ්‍ය හා ශ්‍රව්‍යපට, ප්‍රශ්නාවලි හා පැවරුම් සූදානම් කර ගත යුතු වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පංතියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාවට ගෙන ඒමට ගුරුවරයා සම්පත් දායකයකු වේ. අපේක්ෂිත ඉගෙනුම් පල සාක්ෂාත්කරණය හා සිසුන්ගේ ප්‍රවීණතා මට්ටම් පිළිබඳ ව ගුරු සිසු දෙපක්ෂය ම දැනුවත් විය යුතු ය. ඇගයීම හා තක්සේරුකරණ උපදෙස් යටතේ ඉගෙනුම් පල ඉලක්ක කොට ගනිමින් සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී හෝ සුදුසු අවස්ථාවල දී ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය ප්‍රශ්න සඳහන් කර ඇත. ඒ සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කරගැනීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සුවිශේෂ අංගයකි. ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය නිම කර සිසුන්ගේ දැනුම තහවුරු කිරීම සඳහා ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ කටයුතු සැලසුම් කිරීමේ උක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොටගත් නූතන ගුරු භූමිකාව, පරිණාමන ගුරු භූමිකාව (Transformation Role) ලෙස නම් කර තිබේ.

නිර්මාණශීලී ගුරුවරයකු ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කරගැනීම සඳහා සරල මග පෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීමේ කාර්යය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවා යි පතමු.